# අනේ මන්දා

?

ආර්.එම්.ඉමාෂා උදයාංගනී රත්නායක

# අනේ මන්දා?

ආර්.එම්.ඉමාෂා උදයාංගනී රත්නායක

**ISBN- 9-766242-066837**

**සියලුම හිමිකම් ඇවිරිණි.**

කර්තෘගේ අවසරයකින් තොරව මෙම කෘතියේ කොටස් උපුටාගැනීම, කවර මාධ්‍යකින් හෝ පළ කිරීම සපුරා තහනම් වේ.

2023.11.15

# පිදුම

## මෙතෙක් පැමිණි සියලු බාධාවන් ට...

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අතදැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්ව පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතයි තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශකත්යික් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

නිසලව තිබූ පරිසරය කෙමෙන් කෙමෙන් සසල විය. එක්වරම පැමිණි චණ්ඩ මාරුතයකින් වනස්පතීහු නටන්නට පටන් ගත්හ. නිලට නිලේ තිබුණු පැහැදිලි නිලඹර රිදී පැහැ වලාකුළුවලින් බරවත් ම ද්‍රැමයන්ගේ පත්‍ර විසිරී ගියේ ය. කුඩා කොලු ගැටිත්තන් බිය වද්දන්නට මෙන් අඳුරු වලාවන් ගැටුණේ විශාල ආලෝකයක් හා කන දෙදරා යන හඬකිනි. තණපිටියේ සෙල්ලම් කරමින් සිටියවුන් තම නිවසට දිව්වේ ඒ හඬින් ඔවුන්ව පන්නා දැමීමක් හා සමානව ය. වැසි පොද සෙමෙන් ඇද හැලී දරුණු අතට හැරුණි. ඈත සිට නිවසට කවුරුදෝ දිව එනවා ඔහුට දිස් විය. ඒ ඡායාව කල් යත්ම ඔහු ගමේ පුද්ගලයෙකු බවට හඳුනා ගැනීමට ගත වූයේ නිමේෂය කි.

''අයියෝ... බලාපන් කොලුවෝ එකපාරට ම වැස්සනේ...''

දිව ගෙන ආ පුද්ගලයා අනවසරවෙන් ම නිවසට ගොඩ විය. ඔහුත් ඊට ඉඩ දුන්නේ තදින් ම වර්ෂාව ඇද හැලෙන නිසාවෙනි. ඔහු කුස්සියට ගොස් ළිප අවුළුවා වතුර කේතලයක් ළිපෙහි තැබුවේ පැමිණි අමුත්තාට කෝපි උගුරක් ලබා දීමට ය. මන්ද අමුත්තා වැස්සෙන් හොඳටෝ ම බැට කා ඇති නිසාවෙනි.

''උඹට පින් කොලුවෝ''
ඔහු කෝපි කෝප්පය අමුත්තාට ලබා දුන්නේ ය.

''කොලුවෝ ඇත්තටම උඹ කවුද?''

''කොහෙන් ද ආවෙ?''

''අම්මා අප්පා කවුද?''

''උඹට නමක් ගමක් තියේ ද?''

අමුත්තා ප්‍රශ්නාවලියක් ම ඉදිරිපත් කළේ ය. නමුත් ඔහුගෙන් පිළිතුරකට ලැබුණේ නිහඬතාව පමණි.
අඩ හෝරාවකට පමණ පසු පරිසරය නැවතත් යථා තත්ත්වයට පත් වුණි.

''උඹ නම් අමුතු එකෙක් කොලුවෝ''

''ඉඳා මේ කෝප්පය ගනින්''

''මං ගොහින් එන්නම්''

අමුත්තා එසේ කියා ගියේ ය.

''හැබෑටම ඔය අලුතින් ගමට කඩා වැදුණු කොල්ලා කවුද''

''මහා ලොකු වයස පාටකුත් නෑ''

''කොළඹ රටකින් ආවාවත් ද''

''හැමෝටම හැමදාම හැංගිලා ඉන්න බැහැනේ''

මාසයකට පමණ පෙර ගමට පැමිණි පුද්ගලයා පිළිබඳව ගම්මුන්ගේ විවිධ මති මතාන්තර ගොඩනැගුණි. අයෙක් ඔහුව වර්ණනා කළ අතර තවකෙක් දොස් නැගූහ.

''ඈ බන් සුමනෙ උඹ කීවා නේද අර කොල්ලා උඹට හොඳට සංග්‍රහ කළා කියලා...''

''ඔව් ගැනියේ මට ඒ කොල්ලා හොඳට සැලකුවා උගෙ එහෙම වැරැද්දක් නම් පේන්න තිබුණේ නැහැ''

''ඌ මයෙ එක්ක කතා කරපු නැති එකයි කාරණාව''

''ඔහෙ කොහොමද ඌව සුද්ද කරන්නේ''

''මොකෝ ඔහෙ ඒකව කාලවත් බැලුවද''

සමහර තැනක වූ දෙඩවීම්වලදී අලුතින් ගමට පැමිණි පුද්ගලයාට පිහි පහරවල් නොවැදුනාත් නොවේ.

ගිරි මුදුනින් නැගි සූර්යාලෝකය තෙතබරිතව තිබූ පරිසරය වියළන්නට ඇරඹීය. කැදලි වලට වී ගුලිව සිටි විහඟ කැල තම පියාපත්වල හිරි ඇරගන්නටදෝ සැමතැනම පියැඹූහ. ගොපලු මහත්වරු ද තම මී හරක් පට්ටි රැගෙන තණ පිටි කරා ඇදුණහ. ගොවි මහත්වරු ද කෙතට ගියේ අස්වැන්නට කුමක් වී දැයි බැලීමට ය.
''අනේ දෙයියනේ අදත් මහ එකා ඇවිත්නෙ''

''මේ බලහන්කො මගෙ ගොයම් ටික දලු දාන් ආවා විතරයි මූ පාගා දාලා නේ''

''අයියෝ...

''වැඩක් නෑ අයියා ඕවා ඔය මහ උන්දැලගෙ වැඩ, අච්චර කලක් මේ මහ මූකලානෙ අලි ඇත්තු හිටියා උන් ආව ද අපේ වතු විනාශ කරන්න, මේ අලුතින් ගෙනත් දාන උන් නේ, උන් ඉතින් පාරවල් එහෙම හොයා ගන්නකම් ඔහොම තමයි.''

''ඔව් බන් නංගියෙ මේ මිනිස්සු සත්තුන්ට නිදහසේ ඉන්න දෙන්නෙත් නෑ, ගස් කපනවා. එහෙව් එකේ අපි මක් කොරන්ටද?''

නීලගම ගම් වැසියන්ට මහත් අභියෝගයක් වූයේ වන අලින්ගෙන් තම වගා බිම් ආරක්ෂා කර ගැනීමයි. තිරිසන්නු බඩ කට පුරවා ගැනීමට තැන් තැන්වල ඇවිදිති. කිසිදු බසක් නොතේරෙන උන් එසේ සැරිසරන්නේ ඉවසා දරා සිටීමට නොහැකි ගින්දරක් නිවා දැමීමට නොවෙද...?

වැල් ඇඳෙහි වැතිරී සිටි ඔහුව සූරිය ළහිරු බිඳු එකිනෙක සිප ගන්නට විය. එනැයින් ඔහු හුන් තැනින් නැගිට්ටේ ය. මද වේලාවක් අහසෙහි පියාඹන මාල ගිරව් දෙස බලමින් ඔහු මොනවාදෝ මිමිණුවේ ය. නිදිමත හැරදා ඔහු සරොම් කැබැල්ලකුත් රැගෙන ළිපෙන් අඟුරු කැබැල්ලක් ද කටේ දමා අතුල්ලමින් දොළ පැත්තට පියමැන්නේ ය. දත කට වත දොළෙහි ලා පිරිසිදු කරගෙන ඔහු නැවත පැමිණියේ ය.

''මාමේ... මාමේ...''

''අපේ බෝලෙ වත්තට ආවා...''

''චුට්ටක් හොයලා දෙනවද?''

''එන්න, එන්න, බලමු මේ මාමට කන් ඇහෙන්නෙ නෑ මන් අහගෙන එදා සෝමා නැන්දා කියනවා''

''ආ වරෙල්ලා. එහෙනම් අපි හොයන් යමු.''

''මෙන්න මෙතන තියෙනවා අරගනින්''

''සුරන්, අර දං කඩාගනින්''

''අනේ! මටත් ඕනේ''
තණ පිටියේ සෙල්ලම් කරමින් සිටියවුන්ගේ පන්දුව වැටී තිබුණේ ඔහුගේ නිවසෙහි මිදුලෙහි ය. කොල්ලෝ වත්තේ තිබෙන දං ගෙඩිවලට පොරකන්නේ මී කුණකට හසු වූ කුහුඹු රැළක් මෙනි. ඒ අපූරු ළමා කැල දෙස බලමින් ඔහු නිහඬව සිටියේ ය. සමහර විටෙක මද සිනහවක් නැගුණේ ය. මන්ද ගැටවර වියෙහි සුන්දර සිදුවීම් කැටි කර ගත් සුන්දර අතීතයක් ඔහුටත් තිබීමට හැකි නිසාවෙනි.

''ඔන්න එනවා බිහිරියා ගහපල්ලා ඔය දංවලින්''

''හූ... හූ...''

කොල්ලෝ ඔහුගේ ගත දංවලින් නැහැවූයේ ය. සුදු පිරුවට හැඳ සිටි ඔහුගේ වස්ත්‍රය දම් පැහැයට හැරුණි. ඊට පිළිතුර වූයේ ද නිහඬව බලා තම මගෙහි ගමන් කිරීමයි. කොලු ගැටිත්තෝ බලාපොරොත්තු වූයේ මහ පොල්ලක් අතේ තබාගෙන ලුහු බඳින චරිතය කි. එය එසේ නොවීම නිසා එය මහා විස්මය ගෙන දෙන්නකි.

★ ★ ★ ★

විහඟ කිචි බිචියත් සමඟ අරුණාලෝකය කඳු මුදුනට වැහෙන්නට පටන් ගත්තේ ය. වන රොදෙහි ඇති ගස්වලින් ආලෝකය පෙරී පොළොවට වැටෙන විට දැකිය හැකි මනස්කාන්ත දසුන නෙතට මෙන් ම මනසට ද රසඳුනකි. දිය පිපාසයෙන් පෙළෙන සත්තු ද උදෑසනම තම අවශ්‍යතා ඉටු කර ගැනීමට අලසව දිය වළවල් කරා ඇදෙති. එම දර්ශනය දුටුවහොත් හෙතෙම සතු අලස බව මැකී යන්නේ නිරායාසයෙ නි.

අද දවස කොලු කෙල්ලන්ට හොඳ දවසකි. මන්ද අද පන්සලේ  අකුරු කියා දෙන්නට අලුත් ඇදුරෙක් පැමිණ සිටින නිසා ය. තම තමාට හැකි අයුරින් හැඳ පැළඳ ගල් කුරයි ගල් ලෑල්ලයි අතේ තබාගෙන අවට ඇති ගස්වල රසඵලවල රස විඳිමින් යන ඒ කැකුළු කැකුළියන්ගේ නිදහස වත්මන් සිසුවෙකුට අංශු මාත්‍රයකුදු හෝ නැති තරම් ය.

කොලු කෙල්ලන් අකුරු කර හමාර වී විගස පැමිණියේ වැවෙහි වාන් දමා ඇති තැනටයි. ඔවුහු ඇඳ හුන් ඇඳුම් විසි කර ජලයට බැස්සේ ගොඩෙහි සිට දියට පැණීමට දඟලන මාළුවන් සේය. ඇති පදම් ජල ක්‍රීඩාවේ නිරත වූ ඔවුහු සවස් වන තෙක් ම ජලයේ හුන්හ.

''හනේ... හනේ... ඔය මදැයි ඔය හිටියා වරෙල්ලා ගොඩට නැත්නම් උඹලට උණ හැදේවී''

''අනේ, සුමනෙ මාමේ ඔතැන ඉන්නෙ නැතිව එන්න අත පය සෝද ගන්න''
හපෝ මං උඹලට රැවටෙන්නෙ නෑ, මම ඔතනට බැස්සොත් මටත් වෙන්නෙ අර කාට ද වුණා වගේ වැඩක් තමා, වරෙල්ලා ගොඩට නැත්නම් මුලාදෑනි මහත්තයට කියනවා''

''හරි හරි අපි එන්නම් ගොඩට''

ළමයි ජලයෙන් ගොඩට පැමිණ තම තමන්ගේ සළු පිළි ඇඳ ගත්හ.

නීලගම ගමෙහි සැවොම සඳ කුමරියට ඇරයුම් කිරීමට සූදානම් වෙති. හිරු කුමරා බැස යනවාත් සමඟ නිදිකුම්බා පැළෑටිත් විවේකයකට සූදානම් වෙයි. හිමිදිරියේ තැනීමට පටන් ගත් කැදැල්ල දැක කොබෙයි ජෝඩුවක් ඔබ මොබ පියාසර කරන්නේ ඔවුහු සතු තෘප්තිය සැමට බෙදා දෙන්නාක් මෙනි. අනෙක් සියොත්හු ද තම කැදලි කරා පියඹන්නේ දවසේ වෙහෙස නිවා ගැනීමේ අටියෙනි. කඩුපුල් සේපාලිකා මලුත් සැරසෙන්නේ රැයෙහි අරුමය විඳින්නට ය.

ගමෙහි බිහිරියා නමින් අනුවර්තිත මැදි වියැති තරුණයා  තවමත් කිසිවෙකු සමඟ අදහස් හුවමාරු කර නොමැත. බාගදා එසේ කිරීමට වුවමනාවක් නැති වීමට ද පුළුවන. නැතහොත් ඔහු කවර හෝ විශාල ගැටලුවක පසු වනවා යැයි සිතිය හැකිය.

ගෙයි තිබූ සෑම බඩුවක් ම පෙරළා ඔහු යම් දෙයක් සෙවීමට පටන් ගත්තේ ය. පසුව පෙට්ටියක තිබී එය ඔහුට හමු වුණි. සොයාලත් වස්දඬුවත් රැගෙන ඔහු පියමැන්නේ මූකලානෙ අසළ තිබූ ගල් තලාවටයි. සඳ කුමරිය මුළු පරිසරයම බබළන්නට විය. ඉරබටු තාරකාවත් ඇයගේ තනිය මැකීමට මෙන් ඇයගේ අසළම සිටියේය. ගල් තලාවට පෙනෙනා මුළු ගම්මානය දෙස විටින් විට බලමින් ඔහු තදවන් නීල අඹර දෙස බලා මොනවදෝ මිමිණුවේය. වස්දඬුව ගෙන මඳ නළ සමඟ කෙමෙන් කෙමෙන් ඔහු දැහැනකට සම වැදුණේ ය. මියුරු වස්දඬු රාවය අවට පරිසරය තුළ පැතිරී ගියේ ය.

වස්දඬුව වැයීම හමාර කර ඔහු දවසේ වෙහෙස නිම කර ගැනීමට එතන ම වැතිරී දිගු සුසුම්ලමින් අඹර දෙස බලා සිටියේ ය. නොදැනිම ඔහුගේ දෑස් නිලඹර තුළට ම ඇදී ගියේ ය.

ඔහුගේ වතට හිරු එළිය වැටීමත් සමඟ අවදි වූයේ ය. එවිගසට ඔහු වස්දඬුවත් රැගෙන තම නිවසට දිව්වේ ය. වැට මායිමේ සිටුවා තිබූ මඤ්ඤොක්කා ගස් කිහිපයක් උදුරා දමා එහි අල රැගෙන මැටි පොළොව මත තැබුවේ ය. පසුව ඒවා දර ළිප මත තබා තම්බා ගත්තේ ය. මිදුලේ වැටී තිබූ පොල් ගෙඩියත් අහුලාගෙන සම්බෝලයක් සාදා ගත්තේ ය. දින ගණනාවක් හාමත්ව සිටින්නෙකු මෙන් මඤ්ඤොක්කා අල සියල්ල සින්න කළේ ය.

★ ★ ★ ★

මේ ගෙවෙන්නේ අප කවුරුත් ප්‍රියකරන්නා වූ වසන්ත කාලය යි. ඇහැළ ගස් කහ පැහැති කුසුම්වලින් වෙලී පවතී. අඹ,පේර,ජම්බු පලතුරු ගස් පරිසරයට ගෙනෙන්නේ අපූර්වත්වයකි. වනයන්හි සැරිසරන සැවුලන්ගේ සුන්දර ම කාලය මෙම කාලය යි. නිල් පැහැයෙන් තිබූ නීලගම කුඹුරු යායම අස්වැන්නෙන් පිරී ඉතිරී ගොස් ඇත. ගැමියන්ගේ මුවෙහි දක්නට ඇත්තේ ද සිනහව ම පමණි. එය දුටුවන් සියල්ලෝගෙම නෙත තෘප්තියෙන් පිරී යයි.

අස්වනු නෙළන කාලය බැවින් කොලු කුරුට්ටන්ගේ කෙළි බිම වී ඇත්තේ වෙල් ඉපනැල්ල යි. හිමිදිරියේ වනයට ගොසින් ඇති පලතුරක් කඩාගෙන කුස පුරවා ගොම්මන තෙක් කෙළි සෙල්ලම් කරති. විටෙක දබරක් ඇති වුවත් වැඩිහිටියෙකු ඊට ඉදිරිපත් නොවන්නේ එය සුළු මොහොතකට සීමා වන නිසාවෙනි.

කල්යත් ම ගම්මු කාර්ය බහුල විය. මන් ද නව වසරක් ඔවුනට ලබන නිසාවෙනි. ගමෙහි නායකයාගේ සිට ගමෙහි දුගියා තෙක් ම අවුරුදු සැමරීමට දක්වන ප්‍රයත්වය එක හා සමානය.
නිවසේ ඇති මකුළු දැල් ගලවා දුහුවිලි නැහැවී තිබූ නිවස ඔහු පිරිසිදු කළේ ය. නිවස වටා වැවී තිබුණු වල් පැළ ගලවා දමා මඤ්ඤොක්කා දඬු කිහිපයක් රැගෙන සිටවූයේ ය. පසුව ඔහු නිවසට ගොස් බඩු තුණ්ඩුවක් ලිව්වේ ය. දොළට ගොස් ගත සෝදා පිරිසිදු වූයේ ටවුමට ගොසින් නිවසට අවශ්‍ය කළමණා රැගෙන ඒමට ය.

ගමෙහි බස් රථයට නැග ඔහු ටවුමට ගියේ ය. සිල්ලර වෙළඳසැලකට ගොස් ඔහු නිවසට අවශ්‍ය බඩු සියල්ල ගත්තේ ය.වෙළඳසැලෙහි හුන් පිරිස් ඔහුගෙන් විවිධ දෑ විමසන විටදීත් ඔහුගේ නිහඬතාව එලෙස ම තිබුණත් ඇතැම් අවස්ථාවලදී මුවගෙහි චලනයන්ගෙන් ප්‍රතිචාර දැක්වූයේ ය. ගම්මු ඔහුට බිහිරියා කියා ඇමතුවත් එය එසේ නොවන වග ඔවුනට වැටහිණි.

ගම පුරා රතිඤ්ඤා හඬ සමග නව අවුරුදු උදාව සිදු විය. ගමේ සෑම නිවසක ම පාහේ කිරි මුට්ටියක් ඉතිරිණි. ගමේ සියලු දෙනාම නව ඇඳුමින් සැරසී හෙළ සිරිතට අනුව සියලු චාරිත්‍ර ඉටු කෙරිණි.

'කෙල්ලේ... මෙහෙ වරෙන්'
'එන්නම්'
'කෙල්ලේ මේක අර පහළ ගෙදර මාමට ගිහින් දීපන්, ගමේ මිනිහෙක්නෙ.'
'හරි අම්මේ'

සිරියාගේ උපදෙස් මත උපුලි ඔහුගේ නිවසට ගියාය.

'මාමේ... මාමේ...'

ඔහු නිවසෙහි සිට ඉදිරියට ආවේ ය.

'මාමාට සුබ අලුත් අවුරුද්දක්...!'
'මෙන්න මාමට අපෙන් කැවිලි පිඟානක්...'

හෙතෙම සතු වූයේ සිත පුරා ගිය තෘප්තිය කි. නමුදු ඔහුගේ මුවින් එක වචනයකුදු පිට නොවී ය. සිත සනසන මෘදු සිනහවකින් ඔහු කැවිලි පිගාන ගෙන ගෙට ගියේ ය. කුස්සියෙහි මුට්ටියක තිබූ නාරං කැවුම් කිහිපයක් ඔතාගෙන උපුලි හට ලබා දුන්නේ ය. උපුලිත් ඊට ස්තුති කර ඇගේ නිවසට ගියා ය.
කල්යත් ම උපුලි හා ඔහු මිතුරු විය.

'මාමේ මාමගෙ නම කියන්නකෝ...'

'මට නමක් නෑ'

'ඇයි මාමා ගමේ මිනිස්සු එක්ක කතා කරන්නෙ නැත්තේ'

'කතා කරන්න අකමැතියි මම'

'එහෙනම් මයෙ එක්ක කතා කරන්නේ'

'ඔයා අනෙක් අයට වඩා වෙනස් නිසා'

'වෙනස්... මේ මම?'

නිතර නිතර ඇති වූ කතා බස්වලින් ඔවුහු එකිනෙකා හඳුනා ගත්හ.

'මාමාගෙ කතාව අදවත් මට කියනව ද?'

'හරි'

★ ★ ★ ★

'මාව මරන්න අම්මේ'

'ඔය ඔයාගේ අතේ තියන කොස්සෙන් ගහලා මාව මරන්න අම්මේ'

'එතකොට වැහෙයි මගේ කට හැමදාටම'

'තෝව මරන්න නෙවෙයි බැල්ලියේ මෙච්චර දවසක් මමයි අර මිනිහයි දුක් විඳින්නේ තාමත්,

මොකද අපිට කියලා හරිහමන් ඇඳුමක් තියෙනවද?'

'හරියකට වේලක්වත් කන්න තියෙනවද?'

'උඹට හොඳ කරන්නයි තාමත් අර මිනිහයි මායි හැමෝටම තුට්ටු දෙකට ණය වෙවී ඉන්නේ'

ගෙයි මුල්ලක බිත්තියේ පැත්තකට වී හිරුණි හඬන්නට වූවා ය. නන්දාවතී ද අතේ තිබූ කොස්ස පසෙකට විසිකර දමා යන්නට ගියාය.

සවස් යාමයේ මුළු අහස් තලය ම තැඹිලි පැහැ ගැන් වී තිබිණි. හිරුණි ගෙමිදුලේ තිබූ වතුසුද්ද මල් ගසෙන් මල් නෙලුවා ය. මඳ වේලාවක් අහස දෙස බලමින් මොනවාදෝ මිමිණුවා ය. වැඩ ඇරී පා පැදියෙන් නිවසට පැමිණෙන තම පියාගේ හැඩරුව ක්‍ෂණයකින් ඈ හඳුනා ගත්තා ය.

'කෝ නංගි'

'ඔය ඉඳියේ'

'අම්මා'

'අම්මාත් ඉන්නවා කුස්සියේ'

අප්පච්චී විමසූ පැනයන් හට හිරුණි පිළිතුරු දුන්නා ය.

හිරුණි ලබන වර උසස් පෙළ විභාගයට පෙනී සිටින්නිය කි. ඇයට සාමාන්‍ය පෙළ ඉහළ සාමාර්ථයක් තුබූවත් ඇයව නාගරික පාසලකට දැමීමට තරම් දෙමවුපියන් හට වත්කමක් නොතිබුණි. පියාගේ කුලී වැඩවල යෙදෙන්නෙක් බැවින් ඔවුන්ට ස්ථිර ආර්ථිකයක් නොතිබුණි. අඩ නිමාවකින් යුතු නිවසේ හිරුණි ඇතුළු පවුලේ සියලු දෙනා කල් ගෙවූහ. ඇයට සහෝදරියක සිටි අතර ඔවුහු අනේකවිධ දුක් කම්කටොලුවලින් යුත් සිසු දිවියේ බර හද පත්ලට ම කිඳා බැස ඇති නිසා ඈ නිතර ම ද්වේශ සහගතව වචන දොඩවන්නෙක් බවට පත් වී හමාර ය.

'හිරුණි'

'බත් උයලා තියෙන්නේ කන්න ළමයෝ'

'මං කන්නම්'

නන්දාවතී ඇය පාඩම් කරන ස්ථානයට ගොස් විපරම් කර බැලුවා ය.

'අම්මා මං එක්ක තරහ ද?'

මවගෙන් පිළිතුරක් නොවීය.

'අම්මේ තරහද'

එවරද මවගෙන් පිළිතුරක් නොවුණි. එසැණින් හිරුණි හිඳ සිටි පුටුවෙන් නැගිට ගොසින් නන්දාවතීව බදාගෙන හඬන්නට වූවා ය.

'මොකද මේ අඬන්නේ?'

'මට සමාවෙන්න අම්මේ. මගේ වචන මටවත් පාලනය කර ගන්න බැහැ. ඔහේ මගේ කටින් පිටවෙනවා. මම හිතලා නෙවයි අර විදිහට බැන්නේ අම්මාට අම්මා මාත් එක්ක තරහා නෑ නේද?'

'උඹට ප්‍රශ්නයක් ද කෙල්ලේ? මෙච්චරටම උඹට කේන්ති යන්න'

'තව මොන ප්‍රශ්න ද තියෙන ප්‍රශ්නවලින් මාව ගැට ගහලා තියෙන්නේ, මං එක්ක තරහ නෑ නේද?'

'නෑ ළමයෝ, උඹගෙ කට පාලනය කර ගනින් නැත්නම් ළඟදීම මගෙ අතින් උඹෙ කට තැලෙයි'

රාත්‍රී ආහාරයෙන් පසු හිරුණි ඇගේ දින පොතෙහි මෙසේ සටහනක් තැබුවා ය.

අද ජුනි 26. තව මාස ගාණයි විභාගයට. මගේ වචන නිසා අම්මගේ හිත හොඳටම රිදෙනවා. මට මාව පාලනය කර ගන්න බැරි ඇයි? ජීවිතේ එන්න එන්නම රුදුරු වෙනවා. අප්පච්චිගේ මුහුණ රැලි වැටිලා. අත් දෙකේ ම කරගැට. අම්මගේ කකුල් පැලිලා. නංගිත් එන්න එන්නම ලොකු වෙනවා. මේ විභාගෙ හරියට කර නොගත්තොත් පංතියේ සර්ලටත් මම ණය වෙනවා. ආයෙත් සැරයක් කරන්නත් කාලෙ මදි. අප්පච්චි වැඩට යන එක නතර කරන්න ඕන. මම විභාගෙ ඉවර වුණ ගමන් වැඩපොළකට යනවා. එතකොට මේ ප්‍රශ්න හිමින් විසඳෙයි. එන විදියකට මුහුණ දෙනවා. දවසින් දවස උගන්වන පාඩම්වලට බොහොම ස්තුතියි සොබාදම් මවුනි!

පසුදා උදෑසන හිරුණි පංති යාමට සූදානම් විය. ඇයට අමුත්තක් දැනෙන්නට විය. එකපාරටම ඇගේ ආමාශය සිසාරා වමනය එළියට පනින්නට විය. හිසේ කැක්කුමක් ද ඇයට දැනුණි.

'කෙල්ලේ මොකද මේ උඹ වමනෙ කරන්නේ'

'අනේ මන්දා අම්මේ ඔලුවත් කැක්කුමයි'

'අද පංති යන්න එපා ගෙදර හිටපන්'

නන්දාවතී හිරුණි හට කෝපි කෝප්පයකට දෙහි දමා ලබා දුන්නා ය.

★ ★ ★ ★

කල්ගතවත් ම හිරුණිගේ කුස ඉදිරියට නෙරා එන්නට විය. ඇයගේ ශරීරයේ අමාරු ද නන්දාවතීට නුරුස්සන්නට විය. එනිසා ඇයව නන්දාවතී රෝහලකට රැගෙන ගියා ය.

'යමංකො තෝ ගෙදර මං බලා ගන්නම්'

'මොක ද අම්මේ මේ තරහින්, දොස්තර මහත්තයා මොක ද කිව්වේ?'

'වෙන්න තියෙන දේවල් වෙලා ඉවරයි, යමං දැන් ගෙදර'

නන්දාවතී හිරුණිවත් ඇදගෙන ම ගමට ආවා ය. හිරුණිට තම මවගේ හැසිරීම සිතා ගැනීමට නොහැකි විය. නන්දාවතී ගෙදර පැමිණි විගස හිරුණි හට තිබූ ඇඳුම් කැලි බෑගයකට දැමුවා ය.

'අම්මේ මොක ද මේ?'

'උඹට ඕනි ඒකනේ, මේ ටිකත් අරන් පලයන් අපිටත් පව් නොදී'

'අනේ අම්මේ මට කියන්නකෝ...'
හිරුණි තම තවගේ දෙපා මුල ඇද වැටුණා ය.

'උඹ මාව අත්තම්මෙක් කරලා ගමේ උන් දැනගත්තොත් මොනවා හිතයි ද?'

'මොකක්...? අම්මේ මම දන්නෙ නෑ එහෙම දෙයක්'

'උඹ පොඩි එකා, උඹ කවද්ද මිනිහෙක් එක්ක හිටියේ?'

'මං ඉඳියෙ නෑ අම්මේ'

'පල තවත් බොරු නොකියා, අනේ අර මිනිහා දැනගත්තොත්...'

'මම දන්නෑ අම්මේ ඔය විත්තියක්'

'උඹ කරගෙන තියෙන හරිය මදැයි, මම උඹව තැනකට එක්කන් යනවා උන්දැල උඹව බලා ගනියි'

එසේ කියා නන්දාවතී දුව සමග නිවසින් ගියාය.

'හිරුණි කියන්නෙ මගෙ අම්මා, ඒ වගේ ම ඔයාගේ අම්මා මගේ පුංචි, මම මගේ පුංචිව හොයන් ආවේ මෙහෙට, මට එයාව හමු වුණා, ඒත් තාම ඒ ගැන දන්නේ මමයි ඔයයි විතරයි, ආයෙ මේ ගැන අහන්නත් එපා! කාටවත් කියන්නත් එපා!, මොකද මම තාමත් මගේ තාත්තව නොදන්න නිසා. තව දෙයක් මම ඔයාගෙ අයියා වුණාට ඔයා මට කවදාවත් අයියා කියන්නත් එපා! මාමා කියලම කියන්න'

'අනේ මන්දා මාමේ...'

# නිමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන් ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන් ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

# ස්තුතිය

සහය දුන් සැමට!